# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.12.06 පැය 1200 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 2175 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අපරාධ රැසකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.**

2025.11.29 වන දින තලවතුගොඩ පොලිස් වසමේ හෝටලයක් අසලදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 130 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 31 ක් වන බද්දේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු එදිනම කඩුවෙල ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු වැඩිදුර විමර්ශන කටයුතු සඳහා 2025.12.05 දින දක්වා රඳවා තබා ගැනීමේ නියෝග මත රඳවා තබා ගනිමින් විමර්ශන කටයුතු සිදු කර ඇත.

ඒ අනුව, මෙම සැකකරු සංවිධානාත්මක අපරාධකරුවෙකු හා සම්බන්ධ වී තංගල්ල පොලිස් වසමේ උනාකුරුව ප්‍රදේශයේ අඹුසැමි යුවළක් ඝාතනය කිරීම, හික්කඩුව පොලිස් වසමේ කුමාරකන්ද ප්‍රදේශයේ පිරිමි පුද්ගලයෙකු වෙඩි තබා ඝාතනය කර කාන්තාවකට බරපතල තුවාල සිදුකිරීම, අම්බලන්ගොඩ පොලිස් වසමේ අයිස්මෝල ප්‍රදේශයේදී අඹුසැමි යුවළකට වෙඩි තබා ඝාතනය කිරීම හා හික්කඩුව පොලිස් වසමේ නිවසකට රාත්‍රී කාලයේ වෙඩි තැබීම යන අපරාධ වලට සම්බන්ධ සැකකරුවෙකු බවට අනාවරණය කර ගෙන ඇත. ඒ අනුව, සැකකරු සම්බන්ධයෙන් ඉහත අපරාධ වලට අදාලව ගාල්ල, තංගල්ල හා බලපිටිය යන ගරු මහේස්ත්‍රාත් අධිකරණවල නඩු පැවරීමට කටයුතු කර ඇත.

තවද සැකකරුට බද්දේගම ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් නඩු කටයුතු 04 ක් සඳහා විවෘත වරෙන්තු නිකුත් වී ඇති අතර සැකකරු 2025.12.05 වන දින කඩුවෙල ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2025.12.17 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. තලංගම පොලිස් ස්ථානය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**